# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2308/51 - 2022 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2022.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග, 2022 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක් වෙතින් ලබා ගන්නා කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පහත කොන්දේසි සහ නියමවලට යටත්ව සහ පනතෙහි විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, අවම වශයෙන් 30%ක දේශීය අගය එකතු කිරීමක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්වලට (ණයගැතියා) එවැනි ආනයනවලට අදාළ ගෙවීම මූල්‍යනය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත මව් සමාගමෙන් හෝ එකම සමාගම් සමූහයේ සමාගමකින් (ණයහිමියා) අවම අවුරුද්දක (1) සහන කාලයක් ඇතුළුව අවුරුදු තුනකට (3) අඩු ණය කාල සීමාවක් සහිත විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීම සඳහා අවසර ප්‍රදානය කරනු ලැබේ.

i. ආනයනය කිරීමට නියමිත අමුද්‍රව්‍ය භාවිත කරමින් සමාගම විසින් නිපදවනු ලබන අවසාන නිෂ්පාදිතයට, අවම වශයෙන් 30%ක දේශීය අගය එකතු කිරීමක් පවතින බවට, ණයගැතියා විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් නිර්දේශයක් ලබාගත යුතු ය.

ii. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද විධානවලට යටත්ව, ඉහත පරිදි ණය මුදල් ලබා ගැනීම සහ නැවත ගෙවීම සඳහා, ණයගැතියා විසින් ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම - කෙටිකාලීන ණය'' නමින් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

iii. ඉහත පරිදි ලබාගත් ණය මුදල්වලට අදාළ පොළී අනුපාතය, ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළෙඳපොල පොළී අනුපාතවලට සංසන්දනාත්මකව සාධාරණ සහනදායී අනුපාතයක් විය යුතු ය.

iv. සහන කාලයට පසුව ඇති ණය කාල සීමාවට අදාළව ණය මුදලෙහි නැවත ගෙවීම් (පොළිය ද ඇතුළුව) ක්‍රමක්ෂය කළ යුතු ය.

v. අමුද්‍රව්‍ය ආනයනය සඳහා කරනු ලබන ගෙවීම් රටෙහි දැනට පවතින වෙළෙඳ නීතිවලට අනුකූල විය යුතු ය.

මෙම නියෝග, මෙම නියෝගවල දිනයේ සිට අවුරුද්දක (1) කාලයක් සඳහා වලංගු වේ.

EOG 12 - 0056

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.